සියලුම හිමිකම් ඇවිරිණි.
*All Rights Reserved*

## අවසාන වාර පරීක්ෂණය 2015

# ඉතිහාසය - I

**11 ශ්‍රේණිය** **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- **අංක 01 සිට 40 තෙක් වූ ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**

01 සංගමු විහාර සෙල්ලිපිය හා දෙවනගල සෙල්ලිපිය යන මූලාශ්‍ර වලින් තොරතුරු අනාවරණය වන්නේ,

(1) පළමුවන විජයබාහු රජතුමා පිළිබඳවයි.
(2) පළමුවන පරාක්‍රමබාහු රජතුමා පිළිබඳවයි.
(3) දෙවෙනි අග්බෝ රජතුමා පිළිබඳවයි.
(4) සිව්වෙනි සේන රජතුමා පිළිබඳවයි.

02 මගධ රාජ්‍යයේ අගනුවර පාටලීපුත්‍ර නගරයට ගෙනයන ලද්දේ,

(1) ධනනන්ද රජතුමා විසිනි. (2) බිම්බිසාර රජතුමා විසිනි.
(3) අජාසත්ත රජතුමා විසිනි. (4) අශෝක රජතුමා විසිනි.

03 භද්දකච්චායනා කුමරිය පිළිබඳව නිවැරදි ප්‍රකාශනයක් වන්නේ,

(1) පණ්ඩුවාසුදේව රජුගේ මෙහෙසියයි.
(2) පණ්ඩුකාභය රජතුමාගේ මවයි.
(3) පොළොන්නරු යුගයේ දී රාජ්‍යත්වයට පත්වූ තැනැත්තියකි.
(4) දන්ත ධාතුන් වහන්සේ රැකගැනීමට පරාක්‍රමබාහු කුමරු සමග සටන් කළ කෙනෙකි.

04 ආර්ය චක්‍රවර්තිගේ අයකැමියන් විසින් ගම්පළ යුගයේ දී මන්නාරමේ සිට පානදුරය දක්වා තොටුපලවල බදු අයකිරීම වැළැක්වීමට ක්‍රියාකළ සෙන්පතියා වන්නේ,

(1) වීර අලකේශ්වර (2) වීරබාහු
(3) සේනාලංකාධිකාර සෙනෙවිරත් (4) නිශ්ශංක අලගක්කෝනාර

05 රෝමයේ සිස්ටයින් දේවස්ථානයේ වියන් සිතුවම්වල නිර්මාතෘවරයා

(1) මයිකල් ඇන්ජලෝ (2) ලියනාඩෝ ඩාවින්චි
(3) මැසෙක්සියෝ (4) බොටිචෙල්ලි

06 ඉන්දියාවේ මෝගල් අධිරාජ්‍යයා පරිහානියට පත්වීම ආරම්භ වූයේ,

(1) ජොහන්ගීර් අධිරාජයාගේ කාලයේ දී ය.
(2) ඖරංෂෙබ් අධිරාජයාගේ කාලයේ දී ය.
(3) සාජෙහාන් අධිරාජයාගේ කාලයේ දී ය.
(4) හුමායුන් අධිරාජයාගේ කාලයේ දී ය.

07 පුවත්පත් ජනසතු කිරීමේ ප්‍රශ්නය මත 1964 දී බිඳ වැටුණේ,

(1) ඩඩ්ලි සේනානායක මහතාගේ රජයයි.
(2) විජයානන්ද දහනායක මහතාගේ රජයයි.
(3) සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ රජයයි.
(4) එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාගේ රජයයි.

08 දෙවන ලෝක මහා සංග්‍රාමය අවස්ථාවේ අමෙරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරයා ලෙස කටයුතු කළේ,

(1) වුඩ්රෝ විල්සන් (2) ප්‍රැන්ක්ලින් රූස්වෙල්ට්
(3) මිහායිල් ගොර්බචොප් (4) හැරී ටෲමන්

09 නොබැඳි ජාතීන්ගේ සමුළුව පිහිටුවා ගැනීමට මූලිකව කටයුතු කළ රටවල් වන්නේ.

(1) ඉන්දියාව, ශ්‍රී ලංකාව, යුගෝස්ලාවියාව, ඉන්දුනීසියාව හා ඊජිප්තුව
(2) යුගෝස්ලාවියාව, ඉන්දියාව, ශ්‍රී ලංකාව, මාලදිවයින, බංග්ලාදේශය
(3) සෝවියට් රුසියාව, ඉන්දුනීසියාව, ඊජිප්තුව, නේපාලය, මාලදිවයින
(4) ශ්‍රී ලංකාව, ඉන්දියාව, චීනය, ජපානය, මැලේසියාව

10 A තීරුවේ සංවිධාන සමග B තීරුවේ සඳහන් ප්‍රකාශන ගලපා නිවැරදි පිළිතුර තෝරන්න.

| | A | | B |
|---|---|---|---|
| 1. | නේටෝ සංවිධානය | A | සමාජවාදී පිලේ ඔත්තු සේවාව |
| 2. | වෝර්සෝ සංවිධානය | B | ලතින් ඇමෙරිකානු රටවල් සමග ඇ.එ. ජනපදය ඇතිකරගත් සංවිධානය |
| 3. | ජාතික ආරක්ෂක කමිටුව | C | ධනවාදී පිලේ රටවල යුද ගිවිසුම් සංවිධානය |
| 4. | බැල්පර් ප්‍රකාශනය | D | ඊශ්‍රායලය බිහිකිරීමට මුල්විය |
| 5. | ඇමෙරිකානු රාජ්‍ය සංවිධානය | E | සමාජවාදී පිලේ රටවල යුද ගිවිසුම් සංවිධානය |

(1) C E B A D (2) A D B C E (3) C E A D B (4) C D A B E

11 වින්ස්ටන් චර්චිල්, ඇඩොල්ෆ් හිට්ලර්, බෙනිටෝ මුසොලිනී යන පුද්ගලයින් දෙවෙනි ලෝක සංග්‍රාමය අවස්ථාවේ නායකත්වය දැරූ රටවල් වන්නේ පිළිවෙලින්,
(1) ඇ. එක්සත් ජනපදය, ජර්මනිය හා ඉතාලිය
(2) මහා බ්‍රිතාන්‍යය, ජර්මනිය හා ඉතාලිය
(3) සෝවියට් රුසියාව, ජර්මනිය හා ප්‍රංශය
(4) ප්‍රංශය, බ්‍රිතාන්‍යය හා ඉතාලිය

12 ''මියුනික් සම්මේලනය'' යනුවෙන් හඳුන්වන්නේ,
(1) හිට්ලර්ගේ පෝලන්ත ආක්‍රමණය වැළැක්වීම අරමුණු කරගත් එකකි.
(2) ජර්මන් සුඩෙටන් අර්බුදය විසඳීමේ අරමුණින් පැවැත්වූ එකකි.
(3) රුසියාවේ සමාජවාදී ක්‍රියා මර්දනය කිරීමට ගත් පියවරකි.
(4) වර්සේල්ස් ගිවිසුම අහෝසි කිරීමට ගත් ක්‍රියාමාර්ගයකි.

13 ඇමෙරිකා එක්සත් ජනපදය පළමුවන ලෝක සංග්‍රාමයට සම්බන්ධ වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ,
(1) පර්ල් වරායේ නවතා තිබූ ඇමෙරිකානු බල ඇණියකට සතුරන් පහර දීමයි.
(2) පෙරදිග ප්‍රධාන ආරක්ෂක මධ්‍යස්ථානය වූ සිංගප්පූරුවට ජපන් ප්‍රහාර එල්ල වීමයි.
(3) මිත්‍ර පිලේ බල කඳවුරුවලට ජර්මන් ප්‍රහාර එල්ල වීමයි.
(4) ''ලුසිටානියා'' නම් මගී නැව ජර්මන් සබ්මැරීන් විසින් ගිල්වනු ලැබීමයි.

14 ''විප්ලවය මහ ජනතාවට රාත්‍රී භෝජන සංග්‍රහයකට ආරාධනා කිරීම හා සමාන ක්‍රියාවක් නොවේ'' යයි කියමින් තම රටේ ජනතාව විප්ලවය සඳහා පෙළගැස් වූ නායකයා වන්නේ,
(1) විප්ලවවාදියකු වූ වී. අයි. ලෙනින් ය.
(2) කොමියුනිස්ට්වාදියකු වූ මා ඕ සේතුං ය.
(3) නාසිවාදියකු වූ ඇඩොල්ෆ් හිට්ලර් ය.
(4) සමාජවාදියකු වූ බොරිස් යෙල්ට්සිං ය.

15 පහත සඳහන් වන එක්සත් ජාතීන්ගේ ආයතන අතුරින් ලෝක සාමය ආරක්ෂා කිරීම පිළිබඳව ඉහළම වගකීමක් දරන ආයතනය වන්නේ,
(1) ආරක්ෂක මණ්ඩලයයි. (2) ජාත්‍යන්තර අධිකරණයයි.
(3) මහලේකම් කාර්යාලයයි. (4) ආර්ථික හා සමාජ මණ්ඩලයයි.

16 බිහිසුණු ලෙසත්, කෲර ලෙසත් කටයුතු කරමින් මධ්‍යම අමෙරිකානු ප්‍රදේශවල තම ආධිපත්‍යය පැතිරවීමට ක්‍රියා කළ යුරෝපීය ජාතිය වන්නේ,
(1) ඕලන්ද ජාතිකයින් ය. (2) පෘතුගීසි ජාතිකයින් ය.
(3) ඉංග්‍රීසි ජාතිකයින් ය. (4) ස්පාඤ්ඤ ජාතිකයින් ය.

17 නොබැඳි ජාතීන්ගේ සම්මේලනයට පංචශීල ප්‍රතිපත්තිය ඉදිරිපත් කළ රාජ්‍ය නායකයා නම්
(1) යුගෝස්ලාවියාවේ මාෂල් ටිටෝ (2) ඊජිප්තුවේ අබ්දුල් ගමාල් නසාර්
(3) ඉන්දියාවේ ජවහර්ලාල් නේරු (4) ශ්‍රී ලංකාවේ ජේ. ආර්. ජයවර්ධන

18 වෛතුල්‍යවාදී භික්ෂූන් හැට නමක් රටින් පිටුවහල් කිරීමට කටයුතු කළ අනුරාධපුර පාලකයා වන්නේ,
(1) මහසෙන් රජතුමා (2) වංකනාසිකතිස්ස රජතුමා
(3) ගජබාහු රජතුමා (4) ගෝඨාභය රජතුමා

19 යෝධ වැවේ බැම්ම සැතපුම් 7 ක් පමණ දිග චාපයක් ලෙසට නිර්මාණය කිරීමට හේතුවී ඇත්තේ,
(1) කඳු රහිත ප්‍රදේශවල භූමියේ පිහිටීමට අනුව වැව් බැම්ම තැනීමට සිදුවීමයි.
(2) ජලය රැස්වන භූමියේ පාෂාණ සංයුතිය පිළිබඳව සැළකිලිමත් වීමට සිදුවීමයි.
(3) පොළොවේ ක්වාට්සයිට් පාෂාණ විහිදීම ගැන අවධානය යෙදීමට අවශ්‍ය වීමයි.
(4) පහසුවෙන් කෙත් බිම් කරා ජලය ගෙනයාමට හැකිවීමයි.

20 ජලාශ්‍රිත ශිෂ්ටාචාර යුගයේ දී නිගම, නියම්ගම්, නියමතන යන නම්වලින් හඳුන්වා ඇත්තේ,
(1) දඬු වැටකින් ආරක්ෂා කරගත් ගමයි.
(2) වන සතුන්ට විවෘතව පැවැති කිසිම ආරක්ෂාවක් නොවූ ගමයි.
(3) රජතුමා විසින් නිලධාරීන්ගේ සේවය සඳහා ප්‍රදානය කරන ලද නින්දගම් ය.
(4) සෙසු ප්‍රදේශවලට වඩා වෙළඳාම දියුණුවී පැවැති වෙළඳ නගරයන් ය.

21 රට අභ්‍යන්තර ප්‍රදේශවල ජීවත් වූ ප්‍රාග් ඓතිහාසික මානවයා වෙරළබඩ ප්‍රදේශ සමග ද සම්බන්ධතා පවත්වා ගත් බව තහවුරු වන කරුණක් වන්නේ,

(1) ජ්‍යාමිතික ක්ෂුද්‍ර ගල් මෙවලම් භාවිත කිරීම.
(2) මුහුදු බෙලිකටු හා ලුණු භාවිත කළ බවට සාක්ෂි හමුවීම.
(3) ආහාර පිසීම සඳහා කුඩා ප්‍රමාණයේ ලිප් භාවිතා කර තිබීම.
(4) හිස්කබල්වල ගුරුගල් ආලේප කිරීමට පෙළඹීම.

22 A හා B තීර ගලපා නිවැරදි පිළිතුර තෝරන්න.

| | A | | B |
|---|---|---|---|
| 1. | හින්දුකුෂ් කඳුකරයෙන් ඔබ්බට සටන් මෙහෙයවා වාහ්ලිකයින් පරාජය කිරීම | A | බිම්බිසාර |
| 2. | අශ්ව මේධ යාගය පැවැත්වීම | B | පළමුවන චන්ද්‍රගුප්ත |
| 3. | දිග් විජය වෙනුවට ධර්ම විජය ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම | C | දෙවෙනි චන්ද්‍රගුප්ත |
| 4. | සෙසු රාජාණ්ඩු අභිබවා මගධය විශාල ප්‍රදේශයක ව්‍යාප්ත කිරීම. | D | සමුද්‍රගුප්ත |
| 5. | කුමාරදේවී නම් ලිච්ඡවි කුමරිය විවාහ කරගෙන මහාරාජාධිරාජ ලෙස අභිෂේක ලැබීම | E | ධර්මාශෝක |

(1) C D E B A (2) C D E A B (3) A C D B E (4) A D C B E

23 A තීරුවේ සඳහන් වන දේශ ගවේෂකයින්ගේ සොයාගැනීම් B තීරුවෙන් ගලපා නිවැරදි පිළිතුර තෝරන්න.

| | A | | B |
|---|---|---|---|
| 1. | වස්කෝ ද ගාමා | A | පිලිපීන් දූපත් |
| 2. | බර්තොලමියු ඩයස් | B | ඉන්දියාව |
| 3. | පර්ඩිනන්ඩ් මැගලන් | C | බටහිර ඉන්දීය දූපත් |
| 4. | ක්‍රිස්ටෝපර් කලම්බස් | D | කුණාටු තුඩුව |

(1) A C B D (2) B C D A (3) B C A D (4) B D A C

24 පෙරදිග රටකදී පෘතුගීසීන්ට අන්ත පරාජයක් හිමිවූයේ මුල්ලේරියා වෙලේ සටනේදී ය. එම සටන මෙහෙය වූ දෙපිළේ නායකයින් වන්නේ,

(1) අපොන්සු පෙරෙයිරා ද ලසර්දා හා ටිකිරි බණ්ඩාර කුමරු
(2) දොන් ජෙරනිමෝ ද අසවේදු හා පළමුවන රාජසිංහ
(3) පේරෝ ලෝපෙස් ද සූසා හා පළමුවන විමලධර්මසූරිය
(4) කොන්ස්තන්තීනු ද සා හා රාජසිංහ කුමරු

25 කෝට්ටේ රාජධානිය හා සම්බන්ධ සිදුවීම් කිහිපයක් පහත සඳහන් වේ. ඒවා අතුරින් 1597 දී සිදුවූ වැදගත් සිදුවීම තෝරන්න.

(1) ධර්මපාල රජතුමා කෝට්ටේ අතහැර කොළඹ කොටුවට ගොස් පදිංචි වීම.
(2) කෝට්ටේ රාජ්‍යය පෘතුගීසීන්ට තෑගි ඔප්පුවක් මගින් පවරා දීම.
(3) ධර්මපාල රජතුමා මරණයට පත්වීම හා මල්වානේ ගිවිසුම.
(4) හත්වෙනි බුවනෙකබාහු රජතුමාගේ හදිසි මරණය.

26 දකුණු ඉන්දියාවේ හින්දු අධිරාජ්‍යයක් වූ විජයනගර අධිරාජ්‍යයේ ආරම්භක පාලකයින් වන්නේ,

(1) මුබාරක් ෂා සහ මහමුද් ෂා (2) ඉස්මයිල්මුව හා බහමන්ෂා
(3) ක්‍රිෂ්ණ දේවරායි හා රශියා රජින (4) හරිහර හා බුක්ක

27 ''නිදහස, සමානාත්මතාව හා සහෝදරත්වය'' යන තේමාව පදනම් කරගෙන අන් සියල්ලටම වඩා මිනිසා උතුම් කොට සැළකිය යුතුය යන අදහසින් ඇතිවූ විප්ලවය නම්

(1) ඉංග්‍රීසි විප්ලවයයි. (2) ප්‍රංශ විප්ලවයයි.
(3) අමෙරිකානු නිදහස් සටනයි. (4) රුසියානු විප්ලවයයි.

28 මෙරට මුහුදු බඩ ප්‍රදේශ පාලනය කළ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයකු වූ තෝමස් මේට්ලන්ඩ් තුමා හා සම්බන්ධ ප්‍රකාශයක් වන්නේ,

(1) රාජකාරි ක්‍රමය අහෝසි කිරීම.
(2) මුඩු බිම් පණත මගින් උඩරට වගා නොකළ ඉඩම් අත්පත් කර ගැනීම.
(3) උඩරට ආක්‍රමණයකොට පරාජයට පත්වීම.
(4) ජූරි සභා ක්‍රමය හඳුන්වා දීම.

29 එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ නිෂේධ බලය හිමි මහ බලවතුන් පස්දෙනා වන්නේ,

(1) ඇ. එ. ජනපදය, ප්‍රංශය, සෝවියට් රුසියාව, ජර්මනිය, චීනය
(2) මහා බ්‍රිතාන්‍යය, ප්‍රංශය, චීනය, ජර්මනිය, ඇ. එ. ජනපදය
(3) ඇ. එ. ජනපදය, ඉන්දියාව, ප්‍රංශය, ජපානය, චීනය
(4) ප්‍රංශය, චීනය, සෝවියට් රුසියාව, මහා බ්‍රිතාන්‍යය, ඇ. එ. ජනපදය

30 ක්‍රි. ව. පළමුවන සියවස තරම් මුල් කාලයේ දී පවා ශ්‍රී ලංකාවේ මහ වැව් කරවීමට පුරෝගාමී වූ රජතුමා

(1) ධාතුසේන රජතුමා (2) වසභ රජතුමා

(3) පණ්ඩුකාභය රජතුමා (4) මහසෙන් රජතුමා

31 *x* හා y තීර ගලපා නිවැරදි පිළිතුර තෝරන්න.

| | *x* | | y |
|---|---|---|---|
| 1. | ජාතක කථා පොත සිංහලට පරිවර්තනය කරවීම. | A | හයවෙනි පරාක්‍රමබාහු |
| 2. | කැලණි විහාරය ප්‍රතිසංස්කරණය කරවීම. | B | හතරවන පරාක්‍රමබාහු |
| 3. | වන්නි නායකවරු අවනත කරගැනීම. | C | හතරවන බුවනෙකබාහු |
| 4. | සේනාලංකාධිකාර සෙනෙවිරත් අගමැති ලෙස පත්කිරීම. | D | තුන්වෙනි විජයබාහු |

(1) B D A C (2) C A D B (3) A C B D (4) B D C A

32 පඬුවස්දෙව් රජුගේ අගමෙහෙසිය බවට පත්වූ භද්දකච්චායනා කුමරිය ඇතුළු පිරිස ශ්‍රී ලංකාවට ගොඩබැස්සේ,

(1) ජම්බුකෝළ පට්ටන වරායෙනි. (2) ලංකා පට්ටන වරායෙනි.

(3) ගෝකණ්ණතිත්ථ වරායෙනි. (4) මහාතිත්ථ වරායෙනි.

33 ඉතිහාසය විෂයය ඉගෙනීමේ දී වැදගත්වන පුරා විද්‍යාත්මක මූලාශ්‍ර පමණක් ඇතුළත් වන පිළිතුර තෝරන්න.

(1) සෙල්ලිපි, කැටයම්, මූර්ති (2) කාසි, නටබුන්, කැටයම්

(3) නටබුන්, සෙල්ලිපි, කාසි (4) අටුවා, නිසණ්ඩු, කාසි

34 සීමිත ඡන්ද බලයක් ප්‍රයෝජනයට ගනිමින් ප්‍රථම වරට මෙරට ව්‍යවස්ථාදායකයට නියෝජිත පිරිසක් තෝරා පත්කර ගනු ලැබූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය නම්

(1) 1921 මැනිං ප්‍රතිසංස්කරණයයි. (2) 1910 මැකලම් ප්‍රතිසංස්කරණයයි.

(3) 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණයයි. (4) 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණයයි.

35 පහත ප්‍රකාශන අතුරින් වැරදි ප්‍රකාශය තෝරන්න.

(1) හත්වන බුවනෙකබාහුගේ ඇවෑමෙන් ධර්මපාල කුමාරයා කෝට්ටේ රජ බවට පත්විය.

(2) පළමුවන විමලධර්මසූරිය නමින් උඩරට රජවූයේ කොනප්පු බණ්ඩාරයි.

(3) කුසුමාසන දේවිය කරල්ලියැද්දේ බණ්ඩාර රජුගේ එකම දියණියයි.

(4) උඩරට ජෝතිය සිටාණන්ගේ කැරැල්ල මර්දනය කළේ සපුමල් කුමාරයා ය.

36 වළගම්බා රජුගේ කාලයේ දී මෙරටට පැමිණි විදේශීය ජාතිකයකුට අසන්නට නොලැබෙන සිදුවීම තෝරන්න.

(1) දුටුගැමුණු රජතුමා චෝළ පාලනයෙන් රට මුදවාගෙන එක්සේසත් කළේය.

(2) මහසෙන් රජතුමා මහා විහාරයට එරෙහිව කටයුතු කිරීම නිසා මහජනයා කැරලි ගැසූහ.

(3) එළාර රජතුමා යුක්තිගරුක පාලකයකු ලෙස අවුරුදු 44 ක් රට පාලනය කළේය.

(4) අසේල රජතුමාගේ කාලයේ දී දකුණු ඉන්දීය ආක්‍රමණයක් සිදුවිය.

37 දෙවන ගජබාහු රජතුමා හා පරාක්‍රමබාහු කුමාරයා අතර අත්සන් කරන ලද ගිවිසුම ගැන තොරතුරු සඳහන් වන්නේ,

(1) සිතුල්පව්ව සෙල්ලිපියේ ය. (2) මිහින්තලා පුවරු ලිපියේ ය.

(3) කළුදිය පොකුණ සෙල්ලිපියේ ය. (4) සංඛපාල විහාර සෙල්ලිපියේ ය.

38 පුනරුද අවධියේ කතෝලික පල්ලියට එරෙහිව ඇතිවූ ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයට නායකත්වය දුන් පුද්ගලයින් නම්,

(1) මාටින් ලූතර්, ජෝන් කැල්වින් හා උල්රිච්ස් වින්ග්ලි

(2) ඉරාස්මස්, ජෝන් හස් හා ජෝන් කැල්වින්

(3) මාටින් ලූතර්, ජෝන් කැල්වින් හා වයික්ලිෆ්

(4) බොකැෂියෝ, වයික්ලිෆ් හා ජෝන් හස්

39 චීනයේ කොමියුනිස්ට් පක්ෂය ජයග්‍රහණය කරා ගෙනයාමේ අරමුණින් දීර්ඝ පා ගමනක් මෙහෙයවා ජනතා ආකර්ෂණය ලබාගත්තේ,

(1) යුවං ෂි කායි (2) මාඕ සේතුං

(3) සුන් යත් සෙන් (4) චියැං කායි ෂෙක්

40 යුරෝපා ජාතිකයින්ට පෙරදිගට පැමිණීමට තිබූ වෙළඳ මාර්ග සම්පූර්ණයෙන්ම අවහිර වූයේ,

(1) ජෙරුසලම අවට ප්‍රදේශයේ වන්දනා කිරීම අවහිර කළ නිසාය.

(2) කුරුසියක් පළඳවා ක්‍රිස්තු භක්තිකයින් සටනට යැවීමට පාප් වහන්සේ ක්‍රියා කළ නිසාය.

(3) තුර්කි මුස්ලිම්වරුන් විසින් කොන්ස්තන්තිනෝපලය අත්පත් කර ගැනීම නිසාය.

(4) කුරුස යුද්ධවලට සම්බන්ධ වූ අය ඒ ඒ ප්‍රදේශවල මංකොල්ලකෑමේ ද යෙදුණු නිසාය.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# අවසාන වාර පරීක්ෂණය 2015

# ඉතිහාසය - II

**11 ශ්‍රේණිය** **කාලය පැය 03 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- **I** කොටසේ පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වන අතර **II** කොටසින් ප්‍රශ්න 3 කටත්, **III** කොටසින් ප්‍රශ්න දෙකකටත් බැගින් වනසේ ප්‍රශ්න 06 කට පිළිතුරු සපයන්න.

## I කොටස

01 (අ) පහත (i) යටතේ දක්වා ඇති ස්ථාන සියල්ල සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමෙහි ද, (ii) යටතේ දක්වා ඇති ස්ථාන සියල්ල සපයා ඇති ලෝක ආකෘති සිතියමෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) දේවනගර / නල්ලූර් / කල්පිටිය / මාගම්පුර / කරින්ද නදී / ගම්පොල / උපතිස්සගාම / මුල්ලේරියාව / දක්ඛිණ දේශය / පාචීන පස්ස (ල. 10)

(ii) ක්‍යුබාව / නිව්යෝර්ක් / ඇතන්ස් / මක්කම / ජපානය / හවායි දූපත් / ස්පාඤ්ඤය / සූවස් ඇළ (ල. 08)

(ආ) පහතින් දක්වා ඇති A B C D ප්‍රකාශනවලට සම්බන්ධ පුද්ගලයින් අනුපිළිවෙළින් නම් කරන්න. (ල. 04)

A ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපතිවරයා

B යෝධ ඇළ ප්‍රතිසංස්කරණයට පියවර ගත් බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා

C බටහිර ඉන්දීය දූපත්වලට ගොඩබට ප්‍රථම යුරෝපීයයා

D මහවිලච්චිය, මානාකැටිය ඇතුළු වැව් 11 ක් කරවූ අනුරාධපුර රජතුමා

(ඇ) පහත සපයා ඇති පින්තූර ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


1


2


3

(1) (a) අංක 1 පින්තූරයෙන් දැක්වෙන ශ්‍රී ලංකාවේ පැරණිම සිතියම ඇතුළත් වන විදේශීය ග්‍රන්ථය කුමක් ද?

(b) එය රචනා කරන ලද්දේ කවරකු විසින් ද?

(c) ඔහු ජීවත් වූයේ කවර සියවසේ ද? (ල. 03)

(2) (a) අංක 2 පින්තූරයෙන් පෙන්වන මහනුවර යුගයට අයත් රජතුමා කවුරුන්ද?

(b) එතුමාගෙන් රාජ්‍යයට සිදුවූ සේවාවක් සඳහන් කරන්න. (ල. 02)


(3) (a) අංක 3 න් පෙන්වන පින්තූරය කවර නමකින් හඳුන්වනු ලැබේද?

(b) එහි නිර්මාණ ශිල්පියා කවරෙක් ද?

(c) දක්නට ලැබෙන්නේ කවර රටක කවර නගරයේ ද? (ල. 03)

## II කොටස

02 (i) මේ සමග ඇති ශ්‍රී ලංකා සිතියමේ 1, 2, 3 වශයෙන් දක්වා ඇති මුල් ආර්ය ජනාවාස මොනවාදැයි පිළිවෙළින් නම් කරන්න.




(ii) පහත සඳහන් සිදුවීම් හා සම්බන්ධ රජවරුන් කවුරුන්දැයි නම් කරන්න.

A සංඝමිත්‍රා හිමියන්ගේ පෙළඹවීම නිසා මහා විහාරයට එරෙහිව කටයුතු කිරීම.

B පිළිගත් චාරිත්‍ර අනුව ක්‍රමානුකූල අභිෂේක උත්සවයක් ප්‍රථමවරට පැවැත්වීම.

C මහාරත්තක සෙනෙවියා පරදවා ක්‍රි.ව. 103 දී රජ බවට පත්වීම.

D දෙවෙනි බිසවකගේ පුත්‍රයකු වූ කාශ්‍යප අතින් මරණයට පත්වීම.

(iii) පොළොන්නරු යුගයට අයත් වැදගත් පාලකයින් දෙදෙනෙක් නම්කර ඒ අයගේ කාර්යභාරය වෙන වෙනම කෙටියෙන් පැහැදිලි කරන්න.

(iv) ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ පරිහානිය කෙරේ කාලිංග මාඝගේ ආක්‍රමණය කවරාකාර බලපෑමක් සිදුකර ඇත්දැයි කරුණු 3 ක් ආශ්‍රයෙන් විස්තර කරන්න.

03 (i) ශ්‍රී ලංකාව පිළිබඳව ඓතිහාසික තොරතුරු ඇතුළත් දේශීය සාහිත්‍යමය මූලාශ්‍ර 3 ක් නම් කරන්න.


(ii) ගල්පොත, වෙස්සගිරිය, ගඩලාදෙනිය, බදුල්ල යන ස්ථානවල හමුවී ඇති සෙල්ලිපි කවර වර්ගවලට අයත්දැයි පිළිවෙළින් ලියන්න.

(iii) විදේශීය සාහිත්‍යමය මූලාශ්‍රවලින් හෙළිවන ශ්‍රී ලංකාවේ අතීතය ගැන උදාහරණ 3 ක් වත් ආශ්‍රයෙන් කරුණු පැහැදිලි කරන්න.

(iv) ඉතිහාසය විෂයය ඉගෙනීමෙන් ඔබට අත්වන ප්‍රයෝජන පිළිබඳව කරුණු 3 ක් වත් ආශ්‍රයෙන් විස්තර කරන්න.

04 (i) සීගිරි චිත්‍ර / අවුකන පිළිමය / මිනිසා හා අශ්ව හිස යන කලාත්මක නිර්මාණ සඳහා ආභාෂය ලැබී ඇති ඉන්දියානු කලා සම්ප්‍රදායයන් මොනවාදැයි පිළිවෙලින නම් කරන්න.

(ii) මේ සමග ඉදිරිපත් කර ඇති වැවක දළ සැලැස්මේ 1, 2, 3, 4 වශයෙන් දක්වා ඇති අංග පිළිවෙළින් නම් කරන්න.




(iii) වැවක ආරක්ෂාවට හා ස්ථාවර භාවයට ඉහත අංග මගින් සැලසෙන ප්‍රයෝජන වෙන වෙනම විස්තර කරන්න.

(iv) ජලාශ්‍රිත ශිෂ්ටාචාර යුගයේ මෙරට ජන ජීවිතය සකස් වී තිබූ ආකාරය කරුණු 3 ක් ආශ්‍රයෙන් පහදන්න.

05 (i) ශ්‍රී ලංකාවේ දේශපාලනයට සම්බන්ධ වැදගත් පුද්ගලයින් තිදෙනෙක් පහත A B C පින්තූරවලින් පෙන්වා ඇත. ඒ අය අතුරින් පහත කාර්යයන් හා ගැලපෙන පුද්ගලයින් තෝරා අදාළ අක්ෂරය පිළිවෙලින් ලියන්න.


A


B


C

1. ඩී. එස්. සේනානායක මහතාගේ අභාවය නිසා හිස් වූ අගමැති ධූරයට පත්වීම.
2. 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව සකස් කිරීම සඳහා නායකත්වය දීම.
3. ශ්‍රී ලංකාවේ ප්‍රථම විධායක ජනාධිපතිවරයා ලෙස පත්වීම.

(ii) 1978 දෙවෙනි ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැක්වෙන පරිදි එහි අරමුණු 2 ක් ඉදිරිපත් කරන්න.

(iii) ඉහත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ අධිකරණයේ සංවිධානය හා ක්‍රියාකාරිත්වය පැහැදිලි කරන්න.

(iv) නිදහසින් පසුව ශ්‍රී ලංකාවේ වතු වගාව සම්බන්ධයෙන් ඇතිවූ නව ප්‍රවණතා 3 ක් විස්තර කරන්න.

06 (i) බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව මෙරට ජනයා අරගල දියත් කළ අවස්ථා 3 කි. ඒවා අනුපිළිවෙළින් දක්වන්න.

(ii) පළමුවන නිදහස් අරගලයට සම්බන්ධ නායකයින් දෙදෙනෙක් හා දෙවෙනි නිදහස් අරගලයට සම්බන්ධ නායකයින් දෙදෙනෙක් බැගින් වෙන වෙනම නම් කරන්න.

(iii) ටොරිංටන් සාමි ආණ්ඩුකාරයාගේ ක්‍රියා කලාපය දෙවෙනි නිදහස් අරගලය කෙරේ කර තිබෙන බලපෑම කරුණු 2 ක් වත් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(iv) 1815 දී අත්සන් කළ සිංහල ඉංග්‍රීසි ගිවිසුම 1818 නිදහස් අරගලය කෙරේ බලපා ඇති අන්දම කරුණු 3 ක් ආශ්‍රයෙන් විස්තර කරන්න.

## III කොටස

07 (i) දෙවන ලෝක සංග්‍රාමයට තුඩුදුන් හේතු 3 ක් ඉදිරිපත් කරන්න.

(ii) ඉහත සංග්‍රාමයට සම්බන්ධ වු මිත්‍ර පිළේ රටවල් දෙකක් ද, අක්ෂ පිළේ රටවල් දෙකක් ද බැගින් වෙන වෙනම දක්වන්න.

(iii) මිත්‍ර පිළේ ජයග්‍රහණය තහවුරු කිරීමට මැදිහත්වී ක්‍රියා කළ රටවල් 2 ක් නම් කර එම රටවල් අදාළ ක්‍රියාමාර්ග සාර්ථක කරගත් ආකාරය විමසන්න.

(iv) දෙවන ලෝක සංග්‍රාමයෙන් පසුව ලෝක සාමය තහවුරු කිරීම පිණිස එක්සත් ජාතීන්ගේ සංවිධානය පියවර ගෙන තිබෙන අන්දම අවස්ථා 3 ක් ආශ්‍රයෙන් විස්තර කරන්න.

08 (i) පහත දක්වා ඇති A B C පින්තූර වලින් පෙන්නුම් කරන්නේ කාර්මික විප්ලව යුගයේ නව සොයාගැනීම් 3 කි. ඒවාට සම්බන්ධ වූ පුද්ගලයින් අනුපිළිවෙළින් නම් කරන්න.



A B C

(ii) කාර්මික විප්ලවය මුලින්ම ආරම්භ වූ රට සඳහන් කර ඒ සඳහා බලපෑ හේතු 3 ක් ද දක්වන්න.

(iii) කාර්මික විප්ලවය නිසා ඇතිවූ සමාජයීය ප්‍රතිඵල 2 ක් දක්වා ඒවා ජන සමාජයේ යහපතට හෝ අයහපතට හේතු වී ඇති අන්දම පහදන්න.

(iv) එකල යකඩ හා වානේ කර්මාන්තය සම්බන්ධ නව සොයාගැනීම් 3 ක් ආශ්‍රයෙන් එම කාර්මාන්තයේ වර්ධනය සිදුවූ අන්දම විස්තර කරන්න.

09 (i) ඉන්දියාවේ ජාතික ව්‍යාපාරය හා සම්බන්ධ පහත සිදුවීම් වලට ගැලපෙන පුද්ගලයින් නම් කරන්න.

(a) මුස්ලිම්වරුන් සඳහා වෙනම නිජබිමක් අවශ්‍ය යයි යන අදහස මුලින්ම ඉදිරිපත් කළ තැනැත්තා

(b) ප්‍රගතිශීලී පිළ නමින් ව්‍යාපාරයක් පිහිටුවාගෙන බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව සටන් කිරීම

(c) නිදහස ලබන අවස්ථාවේ ඉන්දියාව පාලනය කළ බ්‍රිතාන්‍ය ප්‍රතිරාජයා

(ii) 1857 දී සිපොයි භටයන් බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව දියත්කළ අරගලයට තුඩුදුන් හේතු 4 ක් දක්වන්න.

(iii) ඉන්දියානු ජාතික කොංග්‍රසය පසුකලෙක දෙපිළකට බෙදීම එහි ක්‍රියාකාරීත්වය මන්දගාමී වීමට හේතුවූ බව සඳහන්වේ. එම දෙපිළට අයත්වූ පුද්ගලයින් සඳහන් කරමින් ඔවුන්ගේ ක්‍රියාකාරීත්වයේ තිබූ පරස්පර විරෝධතා පහදන්න.

(iv) ඉන්දියාව දෙකඩ වීම සම්බන්ධයෙන් මොහමඩ් අලිජින්නාගේ ක්‍රියා කලාපය කොතෙක් දුරට බලපා ඇත්දැයි යන්නට ඔබේ අදහස් ඉදිරිපත් කරන්න.


10 (i) ඉස්ලාම් ධර්මයේ ඉගැන්වීම් 3 ක් ඉදිරිපත් කරන්න.

(ii) ඉන්දියාවට එල්ලවූ දේශපාලන ස්වරූපයක් ගත් මුස්ලිම් ආක්‍රමණ 2 ක් නම් කරන්න.

(iii) ඉන්දියාවේ මෝගල් බලය ස්ථාපිත වීමට බලපෑ වැදගත්ම හේතුව නම්කර එම සිදුවීම දිල්ලි සුල්තානයේ කවර ආකාරයක වෙනස්කම් ඇතිකිරීමට හේතුවීදැයි අගයන්න.

(iv) මෝගල් බලය තහවුරු වන පරිදි ක්‍රියාකළ පාලකයින් දෙදෙනෙක් නම්කර ඔවුන්ගේ කාර්ය භාරය අගයන්න.

01 (අ) (i) ප්‍රශ්නයට අදාළ ශ්‍රී ලංකා ආකෘති සිතියම.




The National e-learning Portal for The General Education

01 (අ) (ii) ප්‍රශ්නයට අදාළ ලෝක ආකෘති සිතියම.




The National e-Learning Portal for General Education